**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව-2022**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය වියාචනය**

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි .මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය වියාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුව ද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07හි 14 (අ) වගන්තියට පටහැනිව මයිලඩි ධීවර වරායේ පුනරාවර්තන ස්වරූපයේ රු.1,140,626 ක වියදම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර ඇති බැවින් ජංගම නොවන වත්කම් ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | මයිලඩි ධිවර වරායේ ඉදිකිරීම් වල කොටසක් අමාත්‍යාංශ ව්‍යාපෘති අංශය විසින් ගෙවීම් කර ඇත. විගණන විමසුමෙහි දක්වා ඇති මුදල පමණක් අමාත්‍යාංශ විසින් අප වෙත යොමුකර ගෙවීම් කරන ලෙස දන්වන ලදී. එමෙන්ම මෙම ඉදිකිරීම් කටයුතු අවසන් වී නොමැති බැවින් මෙම මුදල් තාවකාලිකව කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇත. | පුනරාවර්තන ස්වරූපයේ වියදම් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 14 (අ) වගන්තියට අනුව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ධීවර වරායන්හි ඩීසල් හා භූමිතෙල් ඌණතාවයන්ගේ එකතුව ලීටර් 57,418 ක් වූ අතර එහි වටිනාකම රු.22,781,658 ක් විය. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 25 වගන්තියට අනුව එම තොග හානිය වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඩීසල් හා භූමිතෙල් තොගයන්හි අසාමාන්‍ය තොග ඌනතාවයන් සහ අතිරික්තයන් පවතින වරායන් සම්බන්ධයෙන් මේ වන විට විමර්ශන කටයුතු සිදුවන බැවින් එහි නිරීක්ෂණයන් ලැබීමෙන් අනතුරුව තොග සම්බන්ධයෙන් ගිණුම්ගත කිරීම් කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 25 වගන්තියට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයෙහි ලැබී තිබුණු රු.46,000,000 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 අනුව ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන ලෙස ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 46 ක පමණ ප්‍රමාණයක් ලැබී තිබූ අතර එම ප්‍රමාණය ලාභා ලාභ ගිණුමට ගැලපීම් කර ඇත. | සංස්ථාව වෙත ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත නොකල ධීවර වරායන් සතු දේපළ 87 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.91,205,033ක කුලී ආදායමක් උපයාගෙන තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 13 අනුව එම දේපළ ආයෝජන දේපළක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | වරායන්හි බදු දී ඇති දේපළ , ආයෝජන දේපළක් ලෙස වෙනමම හඳුනා ගැනීමට නොහැකිව ඇත්තේ වරායන්හි දේපළ වලින් කොටස් වශයෙන් බදු දීම හේතුවෙන් දේපළවල වටිනාකම පැහැදිලිව හඳුනා ගැනීමට අපහසු බැවින්ය, ඒ හේතුවෙන් බදු දී ඇති දේපළ ගිණුම් තැබීමේදී දේපළ පිරියත යටතේ දක්වා ඇත. | සංස්ථාවේ ආයෝජන දේපළ හඳුනාගෙන ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 13 අනුව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය තුල වසර 05 ඉක්මවා ඉදිරියට එනු ලබන රු.9,754,409ක ශේෂයක් වූ අතර මෙම ශේෂය මේ වන විට භෞතිකව පවතින ශේෂයක්ද යන්න තහවුරු නොවූ අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 77 අනුව හානිකරණ සඳහා ගැලපීම්ද සිදුකර නොතිබුණි. | කෙරීගෙන යන වැඩ ගිණුමෙහි පෙර වසර වලට අදාලව දක්වා තිබූ රුපියල් 9,754,409 ක වටිනාකම තුල මේ වන විට අවසන් කල කාර්යයන් හඳුනාගෙන 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අවශ්‍ය ගැලපීම් කර ගිණුම් ගතකිරීමට කටයුතු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 77 අනුව මෙම ශේෂය සඳහා හානිකරණ ගැලපීම සිදුකළ යුතු වේ. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් තුළ ඇතුලත් වෙළඳ ගෙවිය යුතු දැහි වටිනාකම රු.10,474,859 ක අඩුවීමක් වුවද එය රු.12,525,850 ක අඩුවීමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යාම් රු.2,050,991 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණන විමසුමෙහි සඳහන් කර ඇති කරුණු සමග එකග වෙමි. නිවැරදි කර ගැනිමට සටහන් කරගතිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂිත ගෙවීම් උපලේඛනය අනුව ශේෂය රු.8,891,397 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් රු.8,031,642ක් ලෙස දැක්වීමෙන් මුදල් ගලායාම් රු.859,755 ක් අඩුවෙන් දැක්වුණි. | ප්‍රවර්තන වර්ෂයේ පාරිතෝෂික වශයෙන් ගෙවීම් කරන ලද මුදල , මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපුම් කර ඇත. පාරිතෝෂික වශයෙන් ගෙවන ලද මුදල මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 06 යටතේ පෙන්වා ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ඇ) | සංස්ථාවේ මෝදර ධීවර වරාය පරිශ්‍රය පෞද්ගලික ආයතනයක් වෙත බදු පදනම මත ලබා දුන් ගිවිසුම 2021 මාර්තු 23 දින අවසන් කර පරිශ්‍රය භාර දී තිබුණද එදින සිට 2022 ජනවාරි 31 දින දක්වා රු.17,000,000ක් බදු කුලී ආදායම ලෙස අය විය යුතු නොවන ශේෂයක් ගිණුම්ගත | නීති අංශයෙන් ලිඛිත උපදෙස් ලබාගැනීමෙන් අනතුරුව, අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමුකර , අධ්‍යක්ෂක මණ්ඩල තීරණයන්ට යටත්ව අවශ්‍ය ගිණුම් සඳහා ගැලපීම් කටයුතු සිදුකරනු ඇත | බදු ගිවිසුම ප්‍රකාරව ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.1,700,000ක් වැඩියෙන්ද සමුච්චිත අලාභය රු.15,300,000 ක් අඩුවෙන්ද හා බදු කුලී ණයගැතියන් රු.17,000,000ක් වැඩියෙන්ද දක්වා තිබුණි. | . | |
| (ඈ) | යාත්‍රාවක් වරායෙන් පිටත්වීමේදී සියලු ගාස්තු නිරවුල් වූ පසු නිදහස් කළ යුතු වුවත් සියළු ගාස්තු නිරවුල් කිරීමට පෙර නිදහස් කළ යාත්‍රා වෙනුවෙන් දික්ඕවිට වරායේ රු.146,047,698 ක් වූ හිඟ නැංගුරම් ගාස්තු අයකර ගැනීම අවිනිශ්චිත වන අතර ඒ සඳහා හානිකරණ වෙන් කිරීමක්ද සිදුකර නොතිබුණි. | දික්ඕවිට ධීවර වරායෙහි පවතින හිග ශේෂයන් අයකරගැනීම සඳහා දැනටමත් ආයතන කිහිපයක් වෙනුවෙන් නඩු පවරා ඇති අතර , අනිකුත් වරායන්හි හිඟව පවතින නැංගුරම් ගාස්තු අයකර ගැනීමට නොහැකි වී ඇත්තේ එම යාත්‍රාවන් බොහොමයක් කාලයක සිට අක්‍රිය තත්වයේ පවතින බැවිනි. | සියලු ගාස්තු නිරවුල් වූ පසු යාත්‍රා නිදහස් කලයුතු අතර අයකර ගැනීම අවිනිශ්චිත නැංගුරම් ගාස්තු සම්බන්ධයෙන් හානිකරණ වෙන් කිරීම් සිදු කළ යුතු වේ. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන අනුව වරායන් 5 ක ණයගැති ශේෂය හා අදාල උපයෝගී ලේඛන අනුව ශේෂය අතර රු.11,121,424 ක වෙනසක් නිරීක්ෂණය විය. | විගණන විමසුමෙහි දක්වා ඇති ණයගැති ශේෂයන් සඳහා ලබා දී ඇති තොරතුරු ප්‍රමාණවත් සහ පැහැදිලි නොවන අතර මේ සම්බන්ධව සොයාබලා නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | මූල්‍ය ප්‍රකාශවල ශේෂ හා උපලේඛන අනුව ශේෂ අතර වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | ධීවර අමාත්‍යාංශයට ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට මේ දක්වා රු.70,717,789 ක ශේෂයක් අයවිය යුතුව පැවතියද මෙම හිඟ ශේෂයට අමාත්‍යාංශය එකඟ වී නොමැති බැවින් අයවීම අවිනිශ්චිත වන අතර ඒ සඳහා හානිකරණ වෙන් කිරීමක්ද සිදුකර නොතිබුණි. තවද මෙම ශේෂයේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අමාත්‍යාංශය සමඟ එළැඹී ගිවිසුම් විගණනයට ඉදිරිපත් වී නොතිබුණි. | ධිවර අමාත්‍යාංශය හා සංස්ථාව අතර ඇතිකර ගන්නා ලද ලිඛිත ගිවිසුමකට අනුව ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් ඉන්වොයිස්පත් පිළියෙළ කර අමාත්‍යාංශය වෙත යොමුකරන අතර, එහි සඳහන් මුදල අමාත්‍යාංශය විසින් නොගෙවීම මත හිග ණයගැති ශේෂයක් පෙන්නුම් කරන අතර මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ සකච්ඡාකර නිරවුල් කරගැනීමට කටයුතු කරනු ඇත. | අයවීම අවිනිශ්චිත හිඟ ණය ශේෂය සඳහා හානිකරණ ගැලපීම් සිදු කළ යුතු වේ. |
| (උ) | ලැබිය යුතු බදු කුලී ආදායමෙන් රු.19,384,026 ක් අවුරුදු 5 කට වඩා පැරණි ශේෂ වේ. ඒවා අයකර ගැනීම අවිනිශ්චිත තත්වයක පවතින අතර ඒ සඳහා හානිකරණ වෙන් කිරීමක්ද සිදුකර නොතිබුණි. | කුලි ණයගැති ශේෂය තුළ වසර 05ක් ඉක්මවා ඇති හිග හිටි ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය නිතීමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිමය අංශය වෙත යොමු කර ඇති අතර, නිති අංශය විසින් මේ වන විට එම | වාර්ෂිකව සංස්ථාවට අයවිය යුතු කුලී ආදායම් අය කර ගැනීමට කළමනාකාරිත් |

| | | | |
|---|---|---|---|
| | | ශේෂයන් අයකර ගැනීම සඳහා නඩු පවරා කොටස් වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. | වය කටයුතු කළ යුතු වේ. |
| (ඌ) | මූලාශ්‍ර ලියවිලි මගින් තහවුරු නොවූ රු.36,659,356ක්වූ ඉදිරියට කල ගෙවීම් ශේෂ 2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ ශේෂ වූ අතර මෙම ශේෂයන් සම්බන්ධයෙන් හඳුනා ගැනීම් සිදු කර මූල්‍ය ප්‍රකාශන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ පෙරගෙවුම් ශේෂයට අදාලව තොරතුරු රැස්කිරීම කමිටුවක් මගින් සිදුකලද ප්‍රමාණවත් සාක්ෂි රැස්කරගත හැකි නොවූ අතර ප්‍රවර්තන වර්ෂයේ පෙරගෙවීම් ශේෂයන්ට අදාලව උපලේඛණ විගණන අංශය වෙත යොමුකර ඇත. | ඉදිරියට කළ ගෙවීම් ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (එ) | කාලවිශ්ලේෂණයක් නොමැති දිගු කාලයක සිට පැවත එන රු.49,780,442 ක් වූ ණයහිමි ශේෂ 13 කට අදාලව මූලාශ්‍ර ලියවිලි නොවූ අතර මෙම ශේෂ පියවීම අවිනිශ්චිත තත්වයක පැවතියද මූල්‍ය ප්‍රකාශනවල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් 1992 වසරේ සිට පැවත එන ශේෂයන් වන අතර , එම ශේෂ සම්බන්ධයෙන් ආයතනයේ විගණන හා කලමනාකරණ කමිටුව වෙත යොමුකර, අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි එම ණයශේෂ කපාහැරීමට අනුමැතිය ලබාගැනීම සඳහා රාජ්‍ය පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලදී. | ණය හිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඒ) | අමාත්‍යාංශ ප්‍රදාන යටතේ ධීවර ප්‍රජාවගේ සුභසාධනය වෙනුවෙන් “ දිරිසවිය“ නමින් පිහිටුවන ලද රු.8,610,910 ක ශේෂයක් මූල්‍ය ප්‍රකාශන තුල ජංගම වගකීම් යටතේ ඉදිරියට ගෙන එනු ලබන අතර ඒ සඳහා කිසිදු මූලික ලියවිලි ඉදිරිපත් නොවූ බැවින් එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | මේ පිළිබඳ අවශ්‍ය ලියවිලි අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත්කර 2024 වර්ෂයේ ගිණුම් වලින් ගැලපීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත. | ශේෂ වල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය මූලික ලියවිලි විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ඉන්ධන විකුණුම් ආදායම | 79,100,471 | 80,168,413 | 1,067,942 | ගිණුම් ප්‍රකාශයට අදාලව සකසා ඇති ලේඛනවලින් ඉහත සඳහන් ශේෂය හඳුනාගත නොහැක. | මූල්‍ය ප්‍රකාශවල ශේෂ හා උපලේඛන අනුව ශේෂ අතර වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වරායන් 07 ක අතැති මුදල් ශේෂය | 29,818,531 | 28,339,857 | 1,478,674 | මේ සම්බන්ධව වැරද්දක් ඇතොත් සොයා බලා නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | මූල්‍ය ප්‍රකාශවල ශේෂ හා උපලේඛන අනුව ශේෂ අතර වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | විවිධ ආයතන වලින් ලැබූ ප්‍රදාන | 928,366,348 | ලැබූ දිනයන්, මුදල් ලැබූ බවට වූ මූලාශ්‍ර ලියවිලි ගිවිසුම් හා නියමයන් ඉටු කරන ලද කාර්යයන් විස්තරාත්මක උපලේඛන, | විගණන විමසුමෙහි දක්වා ඇති ශේෂයන් දීර්ග කාලයක සිට පැවත එන ශේෂයන් වන අතර , මේ සම්බන්ධයෙන් සෑම වසරකදීම විගණන විමසුම් ඉදිරිපත් කර ඇත. මෙම ශේෂයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි සොයා බැලීම සඳහා ආයතනික කමිටුවක් පත්කළ අතර එම කමිටුව විසින් මෙම ශේෂයන්ට අදාලව සොයාගත් තොරතුරු චක්‍ර ලේඛ අංක PED 01/2021(i)ට අනුව ආයතනික විගණන කමිටුව වෙත යොමුකර, එහි අනුමැතිය මත අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමුකල අතර , අධ්‍යක්ෂක මණ්ඩල තීරණයන්ට අනුව මෙම ශේෂයන් පොත්වලින් ඉවත්කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | විගණනය සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. |
| (ආ) | ප්‍රොම් පීච්ඩ් (Prom peached WHT) | 2,215,769 | විස්තරාත්මක උපලේඛන මූලාශ්‍ර ලියවිලි | | |
| (ඇ) | සුනාමියෙන් හානි වූ වත්කම් සඳහා ලද ප්‍රතිපාදන | 945,559,937 | හානි වූ වත්කම් ප්‍රතිපාදනය කිරීමට අදාළව ප්‍රමාණවත් සාක්ෂි ගිවිසුම් හා නියමයන් | | |
| (ඈ) | විලම්භිත බැරකම් | 1,653,400 | විලම්භිත බැරකම් පිළිබඳ මූලාශ්‍ර ලියවිලි | | |
| (ඉ) | කෙරීගෙන යන වැඩ | 28,111,329 | කෙරීගෙන යන වැඩ ලිපිගොනු, සිදුකරන ලද කාර්යයන්, ගිවිසුම් | | |
| (ඊ) | ණයහිමියෝ වෙනත් ණය හිමියෝ | 10,584,147 | අදාළ ශේෂයන් තහවුරු කර ගැනීමට අවශ්‍ය මූලාශ්‍ර ලියවිලි | | |
| (උ) | නැංගුරම් ණයගැතියෝ හා බඳුකුලී ණයගැතියෝ | 91,631,027 | උපලේඛන වයස් විශ්ලේෂණ | | |
| (ඌ) | ඉඩම් හා ගොඩනැගිලි | 2,270,851,082 | වත්කම් ලේඛන උපලේඛන | | |
| (එ) | බැංකු ශේෂය | 166,857,402 | වරායන් වලින් පිළියෙළ කරනු ලබන බැංකු සැසඳුම් ප්‍රකාශ ශේෂ සනාථ කිරීම්. | | |
| (ඒ) | පෙර ගෙවීම් | 15,528,686 | ගෙවීම තහවුරු කර ගැනීමට අවශ්‍ය මූලාශ්‍ර ලියවිලි,වයස් විශ්ලේෂණ සහිත උපලේඛන | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඔ) | ආරක්ෂක ණයගැති ශේෂය හා දික්ඔිවිට පැරණි ණය ශේෂ | 102,009,807 | කේවල ණයගැති ශේෂ, මූලාශ්‍ර ලියවිලි, වයස් විශ්ලේෂණ | | |
| (ඕ) | ණයගැතියෝ, ලැබිය යුතු රඳවා ගැනීමේ බදු හා සන්කෙන් නෞකාව ඉවත් කිරීම වෙනුවෙන් අයවිය යුතු මුදල | 65,070,045 | අදාළ ශේෂයන් තහවුරු කර ගැනීමට අවශ්‍ය මූලාශ්‍ර ලියවිලි | විගණන විමසුමෙහි දක්වා ඇති ශේෂයන් දීර්ග කාලයක සිට පැවත එන ශේෂයන් වන අතර , මේ සම්බන්ධයෙන් සෑම වසරකදීම විගණන විමසුම් ඉදිරිපත් කර ඇත. මෙම ශේෂයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි සොයා බැලීම සඳහා ආයතනික කමිටුවක් පත්කළ අතර එම කමිටුව විසින් මෙම ශේෂයන්ට අදාලව සොයාගත් තොරතුරු චක්‍රලේඛ අංක PED 01/2021(i)ට අනුව ආයතනික විගණන කමිටුව වෙත යොමුකර, එහි අනුමැතිය මත අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමුකල අතර , අධ්‍යක්ෂක මණ්ඩල තීරණයන්ට අනුව මෙම ශේෂයන් පොත්වලින් ඉවත්කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | විගණනය සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. |
| (ක) | සිවිල් ඉංජිනේරු කාර්යයන් සඳහා දැරූ වියදම් | 438,511 | මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු වලට අදාළ සාක්ෂි, ලේඛන හා අදාළ බිල්පත් | | |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු.රෙ. 102 හා 103 (1) | පුරාණවැල්ල ධීවර වරාය පරිශ්‍රයේ රු.4,056,595 ක් වටිනා වැසිකිළි උපාංග වලට අලාභ හානි සිදු කර විනාශ කර තිබුණද මේ සම්බන්ධව අදාළ මු.රෙ | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයින් නිශ්චිතව හඳුනා ගැනීමේ අපහසුව මත නිතීමය පියවර ගැනීමේ හැකියාවන් නොමැති වී | අලාභහානි සම්බන්ධයෙන් මු.රෙ.102 හා 103 (1) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රකාර කටයුතු කිරීම හෝ සංස්ථා කලමණාකාරීත්වය වෙත වාර්ථා කිරීමට හෝ, පොලිසියට පැමිණිලි කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ඇති අතර ඉදිරියේදි මේ පිළිබඳ අවධානය යොමු කර වැසිකිළි පද්ධතිය නිසියාකාරව නඩත්තු කරන ලෙස වරාය කළමනාකරුට උපදෙස් දී ඇත. | |
| (ii) | මු.රෙ.187 (3) | වරායන් විසින් රැස්කරන මුදල් දෛනිකව බැංකුව වෙත ප්‍රේෂණය නොකර අත රඳවාගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වසර අවසන් දින දෛනික ඉන්ධන විකුණුම් ආදායම රු.79,100,471 ක මුදලක් මෙසේ රඳවාගෙන තිබුණි. තවද වරායන් දෙකක සිදුකල මුදල් භෞතික පරීක්ෂාවේදීද රු.35,000,000 ක් හා රු.5,000,000 ද අත රඳවා සිටි අවස්ථාවන් නිරීක්ෂණය වී තිබුණි. | ඉන්ධන අලෙවිය සිදුකරන වරායන්ට අදාළව ඒ ඒ වරාය සඳහා වෙන වෙනම ඉන්ධන ලිපිගොනු පවත්වාගෙන යන අතර එම ලිපි ගොනු තුල වරාය විසින් සකස් කරන ලද සියලුම වාර්තා ඇතුළත් කර ඇති අතර එම සියලු ලිපිගොනු රජයේ විගණන අංශය වෙත ලබා දී තිබුණි. | වරායන්වල දෛනිකව රැස් කරන මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 187(3) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (iii) | මු.රෙ. 371 (5) | අදාල කාර්ය නිම වූ වහාම තත්කාර්ය අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් පුරාණවැල්ල ධීවර වරායේ අවස්ථා 03 කදී ලබාගෙන තිබූ එකතුව රු.474,751ක් වූ අත්තිකාරම් මුදල් නිරවුල් කිරීම සඳහා දින 13-111 අතර කාලයක් ගත කර තිබුණි. | වරායන්හි කාර්යයන් සිදුකිරීමේදී සිටින කම්කරුවන් ප්‍රමාණවත් නොවීම හා සොයාගැනීමේ අපහසුව, අධීක්ෂණ නිලධාරීන් නොමැතිවීම වැනි කරුණු හේතුවෙන් විශේෂ අත්තිකාරම් මුදල් පියවීම සඳහා ප්‍රයෝගිකව දින 14 ඉක්මවන අවස්ථා ඇත. | මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම පියවීමට කටයුතු කළ යුතුවේ. |
| (iv) | මු.රෙ. 371 (2)(ආ) | එක් නිලධාරියකුට එක් වරකදී ලබා ගත හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවද පුරාණවැල්ල ධීවර වරායේ නිලධාරීන් විසින් එම සීමාව ඉක්මවා රු.148,770 හා රු.283,230 අතර පරාසයක් තුල එකතුව රු.1,003,100ක මුදලක් අවස්ථා 5 කදී විශේෂ අත්තිකාරම් වශයෙන් ලබා දී තිබූ අවස්ථා පැවතුණි. | විශේෂ අත්තිකාරම් මුදල් එක් වරකදී ලබා දියයුතු වන්නේ රු..100,000.00 මුදලක් පමණක් වුවද වරායන්හි හදිසි නඩත්තු කටයුතු එනම් සිවිල් හා යාන්ත්‍රික කටයුතු වෙනුවෙන් මෙම අත්තිකාරම් මුදල් ලබා දෙන අතර එහිදී එම කාර්යයේ ස්වභාවය අනුව මුදල් ලබාදීමට සිදුවේ. | අත්තිකාරම් ලබා දීමේදී මුදල් රෙගුලාසි 371 (2)(ආ) අනුව තටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (v) | මු.රෙ.571 (3) | 2006 වර්ෂයේ සිට පැවත එන වසර දෙක ඉක්ම වූ රු.12,858,264 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු, මුදල් රෙගුලාසිය ප්‍රකාර රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු හඳුනාගෙන ඇති අතර ලාභ අලාභ ගිණුමට බැර කිරීමට 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සිදු කර ඇත. | වසර දෙක ඉක්ම වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (3) අනුව තටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1997 මාර්තු 06 දිනැති අංක 965/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 3 වගන්තිය | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ අරමුණු ලෙස ඉන්ධන සැපයීම සහ ධීවර කාර්මිකයින්ට අනුෂාංගික වන අනෙකුත් සේවාවන් සැපයීම දක්වා තිබුණ ද බේරුවල ධීවර වරායේ ධීවරයන්ට ඉන්ධන නිකුත් කිරීම පෞද්ගලික පාර්ශවයන්ට පවරා තිබුණි. | බේරුවල වරායේ ඉන්ධන අලෙවිය පෞද්ගලික අංශයකට පවරා දිමක් සිදුකර නොමැති අතර, වරායේ පවතින ඉන්ධන ටැංකි හරහා ධීවරයන් වෙත ඉන්ධන අලෙවිය සිදුකරනු ලබයි. ඉතා දිර්ඝ කාලයක සිට වරාය භූමිය බදුගෙන, බදුගත් පාර්ශවය විසින් ගොඩනගාගෙන පවත්වාගෙන යන ඉන්ධන අලෙවි සලක් පවතී. | සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1.3 වගන්තිය | සංස්ථාව විසින් 2016-2020 කාලයට පමණක් සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබු අතර ඊට පසු වර්ෂයන් සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල පිළියෙල කර නොතිබුණි. | මේ වනවිට 2023 සිට 2028 වර්ෂ දක්වා සංයුක්ත සැලැස්ම සකස්කර ඇති බව දන්වා සිටිමි. | අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව සංයුක්ත සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5.2.5 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අදාළ මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15කට නොඅඩු කාලයක් තුළ අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් 2022 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද අයවැය ලේඛනය ඒ අනුව අනුමත කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ අයවැය ලේඛන 2021 වර්ෂයේ දෙසැම්බර් මස 29 වන දින ධීවර අමාත්‍යාංශය වෙත භාර දී ඇති අතර අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය වෙත යොමු කරනු ලබයි. 2022 වර්ෂයට අදාළ එම වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම 2024 මාර්තු මස 18වන දින විගණකාධිපති වෙත භාර දී ඇත. | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අයවැය ලේඛනය පිළියෙල කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොත | | | |
| (i) | 4.2.1 ඡේදය | සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් වාර්ෂිකව වර්ෂයේ මුල ප්‍රසම්පාදන සැලස්ම සකස් කරන අතර ඒ අනුව එම වර්ෂය තුළ ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලබයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 ඡේදය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. |
| (ii) | 4.3.1 ඡේදය | සංස්ථාව විසින් සමාලෝචිත වසරට අදාළව සියලුම ආශ්‍රිත වියදම් මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීමත් 4.3.3 ඡේදය අනුව මුලු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීම හා යාවත්කාලීන කිරීම කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන අත්පොතේ 4.3.3 ඡේදය අනුව 2024වර්ෂයේ සිට මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.3.1 ඡේදය අනුව මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිශෝධනය කිරීම හා යාවත්කාලීන කිරීම කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.363,998,388 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.136,222,182 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.500,220,570 හෙවත් සියයට 367 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වරායන් 14 ක මෙහෙයුම් ලාභය රු.460,779,131 කින් හෙවත් සියයට 345 කින් වැඩිවීම හා 2022 වර්ෂයේ ආරම්භ කරන ලද චීන වරාය කැනීම් ව්‍යාපෘතියේ මෙහෙයුම් ලාභය රු.66,310,907 ක් වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

ධීවර වරායන්වල මෙහෙයුම් කටයුතුවලින් ඉපයූ ලාභ/අලාභ තත්ත්වය පහත පරිදි විය.

| ධීවර වරාය | මෙහෙයුම් ලාභය / අලාභය රු. | | අඩුවීම් හෝ වැඩිවීම් ප්‍රතිශතය % |
|---|---|---|---|
| | 2022 | 2021 | |
| බේරුවල | 33,198,600 | 761,297 | 4260.79 |
| ගාල්ල | 44,591,588 | 5,969,142 | 647 |
| මිරිස්ස | 30,891,309 | 4,963,322 | 522 |
| පුරාණවැල්ල | 9,857,422 | (11,161,594) | 188 |
| තංගල්ල | (19,884,663) | (42,361,257) | 53 |
| කිරින්ද | (24,246,631) | (23,119,633) | (4.87) |
| කොඩ්බේ | 14,001,744 | 9,040,677 | 54.87 |
| දොඩන්දූව | (13,589,106) | (13,923,260) | (0.47) |
| හික්කඩුව | (3,754,538) | (19,030,984) | 80.27 |

| | | | |
|---|---|---|---|
| කල්පිටිය | (6,431,832) | (6,304,480) | (2.02) |
| කුඩාවැල්ල | 46,337,294 | 7,263,325 | 537.96 |
| පානදුර | (9,926,405) | (14,980,763) | 33.74 |
| මීගමුව | 22,679,335 | (7,710,157) | 394.14 |
| හම්බන්තොට | (5,380,383) | (23,537,965) | 77.14 |
| අම්බලන්ගොඩ | 32,040,266 | (5,340,880) | 699.90 |
| හලාවත | (12,755,175) | (14,556,192) | 12.37 |
| වාලච්චනේ | (2,603,036) | (14,693,334) | 82.28 |
| නිල්වැල්ල | 17,224,104 | (4,741,902) | 463.23 |
| දික්ඕවිට | 167,773,625 | 77,306,735 | 117.02 |
| සුදුවැල්ල | 7,415,234 | (11,876,324) | 162.44 |
| මයිලඩි | 2,379,773 | (9,349,962) | 125.45 |
| කළමැටිය | (14,362,168) | (16,316,134) | 11.43 |
| වෙල්ලමංකර | 5,775,038 | - | - |
| පැරැලිය | 6,347,415 | - | - |

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව නව ධීවර වරායන් දෙකක් අලුතින් ක්‍රියාකාරි තත්ත්වයට පත්ව මෙහෙයුම් ලාභ ලබා තිබූ අතර බේරුවල, ගාල්ල, මිරිස්ස, කොඩ්බේ, කුඩාවැල්ල හා දික්ඕවිට වරායන්වල පසුගිය වර්ෂවලට සාපේක්ෂව ඉන්ධන ආදායම්, නැංගුරම් ගාස්තු ආදායම් හා කුලී ආදායම් වර්ධනය වීම හේතුවෙන් සියයට 54.87 හා සියයට 4260 අතර පරාසයකින් ලාභ වර්ධනය කරගෙන තිබුණි.

(ආ) තව ද පසුගිය වසරේ අලාභ ලැබූ පුරාණවැල්ල, මීගමුව, අම්බලන්ගොඩ, නිල්වැල්ල, සුදුවැල්ල හා මයිලඩි යන වරායන් සමාලෝචිත වසරේ සියයට 125 හා සියයට 700 අතර ප්‍රමාණයකින් ලාභ උපයාගෙන තිබුණු අතර ඒ සඳහා ඉන්ධන ආදායම්, නැංගුරම් ගාස්තු ආදායම් හා කුලී ආදායම් වර්ධනය වීම බලපා තිබුණි. ඊට අමතරව පසුගිය වසරේ අලාභ ලබා තිබූ වරායන් 6 ක් පමණ ඔවුනගේ අලාභ තත්ත්වයන් සියයට 11 හා සියයට 82 අතර ප්‍රතිශතයකින් අලාභ තත්ත්වයන් මඟ හරවාගෙන තිබුණි.

(ඇ) තවදුරටත් අලාභ තත්ත්වයන් වර්ධනය වී පවතින්නේ කිරින්ද හා කල්පිටිය යන වරායන් දෙක පමණි. ඒවා තවදුරටත් සියයට 5 කට අඩු ප්‍රතිශතයකින් අලාභ ලබමින් පවතී.

(ඈ) සමාලෝචිත වසරේ බේරුවල වැඩ ඒකකය රු.27,709,161 ක අලාභයක් ලබා තිබුණු අතර ඉකුත් වර්ෂයේ එම අලාභය රු.26,802,018 ක් විය. ඒ අනුව එම වැඩ ඒකකය දිගින් දිගටම අලාභ ලබන තත්ත්වයක පවතින බව නිරීක්ෂණය කෙරේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 පෙබරවාරි 25 දින රු.1,242,200 ක් වැයකර කැමරා 32 කින් සමන්විත ආරක්ෂිත සීසීටීවී කැමරා පද්ධතියක් පුරාණවැල්ල ධීවර වරායේ ස්ථාපිත කර තිබූ අතර එම පද්ධතිය ස්ථාපිත කර මාස 02 ක් වැනි සුළු කාලයක් තුළදී එහි කැමරා 02ක් අස්ථාන ගතව තිබූ අතර | මෙම CCTV කැමරා පද්ධතිය සඳහා අදාළ ආයතනය වෙත ප්‍රදානය කිරීමේ ලිපිය ලබා දෙන ලද්දේ 2020.12.28 දින වේ.එම දිනයෙන් පසුව අදාළ ව්‍යාපෘතියේ කටයුතු එම ආයතනය විසින් සිදු කරමින් සිටියදී 2021.01.02 වන දින වරායෙහි | ගිවිසුමේ කොන්දේසි වලට අනුගතව කැමරා පද්ධතිය අළුත්වැඩියා කිරීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | වසර 02ක් වැනි කෙටි කාලයක් තුලදී ස්ථාපිත කල කැමරා 32න් ක්‍රියාකාරීව පැවතියේ කැමරා 10ක් පමණි. | Crane යන්ත්‍රය මගින් සිදුවූ අනතුරකින් එක් කැමරාවකට හානි සිදු විය. මුදල් අය කිරීමකින් තොරව එය එදිනම අදාළ ආයතන විසින් යථාතත්වයට පත් කරන ලදී. ඉහත සඳහන් කර ඇති හේතූන් මත සුළු බිඳවැටීම් කිහිපයක් සිදු වූ නමුත් මෙහි සඳහන් කර ඇති ලෙස සමස්ථ කැමරා පද්ධතියම ස්ථාපනය කොට මාස 02ක් වැනි ඉතා කෙටි කාලයක් තුළ බිද වැටී ඇති බවට සඳහන් කිරීම නිවැරදි කරුණක් නොවන බව සඳහන් කරමි. | කළ යුතු වේ. |
| (ආ) | 2008 වසරේ රු.45,000,000 කට මිලදී ගත් LG 2554 දරන ජංගම දොඹකරය අලුත්වැඩියාව සඳහා 2018 වසරේ සිට 2022 වසරේ ඔක්තෝබර් මාසය දක්වා අමතර කොටස් මිලදී ගැනීම් වෙනුවෙන් රු.4,754,436 ක මුදලක් වැය කර තිබුණද දොඹකරය යථා තත්ත්වයට පත්කර තිබුණේ 2023 වර්ෂයේ බැවින් වැය කළ මුදල නිෂ්කාර්ය වියදම් වී තිබුණු අතර රු.22,000,000 ක පමණ ආදායම් සංස්ථාවට අහිමි වී තිබුණි. | මෙම අලුත්වැඩියාව සංස්ථාවේ සේවකයන් මගින් මෙම අලුත්වැඩියාව සඳහා රු.4,754,436.00ක මුදලකට සිදු කරන ලදි. ඒ අනුව අප සංස්ථා සේවකයන් යොදා කාර්යය නිමකර ගැනීම හේතුවෙන් විශාල මුදලක් ඉතිරිකර ගැනීමට හැකිවිය. ඒ අනුව දොඹකරය යථා තත්වයට පත්කිරීම වෙනුවෙන් දරන ලද රු.4,754,436.00ක මුදල නිෂ්කාර්යය වියදමක් නොවන බව දන්වා සිටීම. | දොඹකරය යථා තත්වයට පත්කර වරායේ කටයුතු සඳහා කඩිනමින් යොදවාගත යුතු වේ. |